
# Koha (Cuckoo) The NewYear bird

## අවුරුදු පක්ෂියා - කොහා



The koha in Sinhala or Koel in Sanskrit and in English the cuckoo is an early bird and unmistakable - its call is so strident and plaintive that it is very easy to whistle in imitation. Each time it calls, I whistle the tune loud and clear and the replies and so do I until he flies closer and closer inquisitively, to sit on a branch of my neighbour's Karapincha tree, to peer into our bedroom, with his red beady eyes to locate what he thinks is a competing male!

The advent of the Koha is associated with the Sinhala New Year, somuch so that the bird is called the Avurudhu Koha - the New Year cuckoo.

The legend is that the Koha never makes a nest of its own. It takes a free ride by laying its eggs in its cousin the crow's nest

And the silly Mrs. Crow unsuspectingly sits on the cuckoo eggs in addition to her own and not only hatches them all very obligingly, but tends and feeds the fledglings until they are able to fly. "Thanks! Ta ta!!" from Mrs. Cuckoo!

**හෙ**ළ බසින් කොහා යයිද, සංස්කෘතයෙන් කෝයල් යනුවෙන් ද, ඉංග්‍රීසියෙන් කුකූ යයිද හඳුන්වන පක්ෂියා ඉතා අළුයම පිබිදෙන කුරුළු ගණයට අයිතිය. උගේ හඬ තියුණුය, එසේම තරමක අදෝනා ස්වරයකින්ද යුක්තය. ඌ නගන හඬ අනුකරණය කරන්නට ලෙහෙසිය. කොහා එසේ උදෑසන හඬන ඇතැම් දිනක මමද ඒ හඬ අනුකරණය කරමින් එවැනිම තියුණු නාදයක් සිවුරුහන් කරන්නෙමි. එවිට කොහාද යළිත් හඬ නගයි. මමද යළිත් ඊට පිළිතුරු දෙන්නෙමි. ඌද යළි යළිත් හඬ නගමින්, ඒ හඬ එන්නේ කෙහෙන්දැයි විපරම් කරමින්, වඩාත් කිට්ටුවට ටිකෙන් ටික පියඹා එයි. අවසානයේ අපේ අසල්වැසි නිවසේ කරපිංචා ගසේ අත්තක වසා තම දිලිසෙන තියුණු රතු ඇස් වලින් අපේ නිදන කාමරය දෙසට එබිකම් කරයි. ඒ සොයන්නේ ඔහුට අභියෝග කළ අනෙක් කොහා කොයි දැයි කියාය.

අප්‍රියෙල් මාසය ළඟා වෙත්ම කොහාගේ පැමිණීම හා හඬ නැගීම පුරාතනයේ සිට සම්බන්ධ කර ඇත්තේ සිංහළ අවුරුද්දටය. එනිසා කොහා අවුරුදු කොහා යනුවෙන්ද හැඳින්වෙයි.

පැරණි ජනප්‍රවාදයට අනුව කොහාට කූඩු හදන්නට දන්නේ නැත. ඒනිසා කොහාගේ ගැනු සතා කරන්නේ තමාට ඥාති සම්බන්ධයක් ඇති කපුටාගේ කපුටු කූඩුවක බිත්තර දැමීමයි. මෝඩ කපුටු නෝනා ඒ බිත්තර තමාගේ යයි සිතා හොඳින් රැක බලාගෙන බිත්තර රකිනවා පමණක් නොව බිත්තර බිඳී කොහා පැටව් එළියට ආවිට ඒ තමාගේ කපුටු පැටව් යයි සිතා කෑම සොයා ගෙන විත් කවා පොවා ලොකු මහත් කරයි. ඒ කොහා පැටවුන්ද පිහාටු වැඩී තටුගසන්නට හැකිවූ විගස "තැන්ක් යූ ආන්ටි අපි එහෙනම් ගිහිල්ලා එන්නම් ට ටා යයි කියා ඉගිලී යන්නේය.

♦ අරන්ත සිරිමාන්න

Text - Arantha Sirimanna

Duke's Court Travel

Fly to Colombo

SriLankan Airlines fr £350 + Taxes

Qatar Airways fr £245 + Taxes

Kuwait Airways fr £260 + Taxes

Emirates fr £480 + Taxes

Etihad Airways fr £334 + Taxes

Oman Air fr £199 + Taxes

Jet Airways fr £195 + Taxes

**Note:** All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

204 King Street, London W6 0RA

✳ ලෙච්වර්ත් බක්මහ උළෙල ✳

2011 අප්‍රියෙල් මස 16 වන සෙනසුරාදා

පෙරවරු 9 සිට දහවල් 12 දක්වා **හිසතෙල් ගෑම**

පස්වරු 1 සිට 5 දක්වා **ප්‍රධාන උත්සවය**

ස්ථානය – Free Church Hall, Letchworth SG6 1NX


විමසීම් - 01462 641326 ලෙච්වර්ත් විහාරය

# උන්චිලි වාරම්!

සිංහල අවුරුදු සමයේ ගමේ ගෙදර වත්තේ ඔන්චිලි බැඳීම අතීතයේ සිට පැවත එන සිරිතකි. ඔන්චිල්ලාව බැඳුනේ උස ගසක අත්තේය. ඊට යොදාගත්තේ ශක්තිමත් වැල්පොටවල් අඹරා සාදාගත් රැහැණකි. පසු කාලයක එය කොහු ලණු අඹරා තැනූ කඹයක් බවට පත්විය. ඔංචිලිපැදීම කුඩා දරුවන්ගේ පමණක් නොව ගම්බද තරුණ තරුණියනගේද මන බඳින ක්‍රීඩාවක් විය.

අතීතයේ ඔංචිල්ලා පදිද්දී කවිද ගායනා කළෝය. එම කවි හැඳින් වුනේ ඔංචිලිවාරම් නමිනි. අපේ ජනකවි කලාව ඉන් පෝෂණය වීය. මේ උන්චිලි වාරම් කවි වලින් කීපයකි.

උඩට උඩින් සුදු
වියන් බඳින් නා
පයට යටින්
පාවාඩ එලන් නා
අවුරුදු කුමරා
ගමට වඩින් නා
උන්චිලි වාරම්
රසට ගැයෙන් නා
එක අත්තක සිට
රැහැයි අඬන් නා
තව අත්තක සිට
කොහා අඬන් නා
එරබදු ගස රතු
මලින් පිරෙන් නා
අවුරුදු සිරියෙන්
ගම පිබිදෙන් නා
දෙන්නා දෙපසින්
ගනිමු රුකුල් ලා
පදිමු නගෝ අපි
උඩ උන්චිල් ලා
උන්චිලි පැදුමට
නැනො වරෙල් ලා
ඉතින් පදිමු අපි
රන් උන්චිල් ලා



උන්චිල්ලාවේ රුකුල්
ගන්න විට
කැඩුණා නැනගෙ
සේද ඔසරි පොට
ලජ්ජා බර ඇගෙ
ඔමරි සිනා වට
බැඳුනා මගෙ සිත
ඔංචිල්ලා වට

♦ නදීකා ප්‍රීති විජයරත්න

Southampton UK

**ශ්‍රීලංකාවේ සුප්‍රකට මීතිරිගල නිස්සරණ වන ආරණ්‍යය භාවනා මධ්‍යස්ථානයේ පූජ්‍ය උඩ ඊරියගම ධම්මජීව ස්වාමීන් වහන්සේ එක්සත් රාජධානියට වැඩමකර සිටිති. භාවනාව පිළිබඳ කීර්තියක් උසුලන උන්වහන්සේ සහභාගිවන භාවනා වැඩසටහන් රාශියක් අප්‍රියෙල් 2 වන දින සිට එංගලන්තයේ විවිධ ආරාමයන්හි පැවැත්වෙන්නේය. ඊට ඔබටද සහභාගිවිය හැකිය. එම ඉදිරි කාලසටහන මෙසේය.**

**Following is the scheduled programme of Ven. Uda Iriyagama Dhammajeeva Thero of Sri Lanka's Meethirigala Nissarana Forest Meditation Centre.**

**17 April - 9 am - London Buddhist Viharaya**
**18 April - 9 am - London Buddhist Viharaya**
**19 April - Birmingham Jetavana Viharaya**
**20 April - 6pm - 9pm -Thames Viharaya**
**21 April -2pm - 9pm -Thames Viharaya**
**22 April - 9 am - Personal day visit**
**22 April - 8 pm Dhamma sessions at the DNS**
**23 April - Departure**

අපගේ හිතවත්
ගණුදෙනුකාර
භවතුන් සැමට
සාමය සතුට පිරි,
සුබ නව වසරක් වේවා!

FAST CASH
SEND TODAY - COLLECT TODAY

020 8886 4488
www.efastcash.biz



ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

Transfer Fees From only £5

ඔබේ මුදල් ඕනෑම BARCLAYS බැංකුවකින් අපේ ගිණුමට බැරකර, අපව අමතන්න.
A/C NAME - C.E.C LTD A/C NO - 70713945
SORT CODE - 20-36-47 BRANCH - HANOVER SQ

Fastcash Financial Services Ltd
125-127 Bramley Road, Oakwood,
London, N14 4UT. Open 7 days.

Fastcash is a MSB registered business with HM Customs and Excise - No. 12112819